**රජයේ නිවේදනයයි**

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

**5 වැනි වගන්තිය යටතේ නියමය**

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම,

(i) 2019 සැප්තැම්බර් මස 30 දිනැති අංක 2143/3 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.02 සහ 03.03 යටතට වැටෙන මාළු ( සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් හැර) ආනයනය සඳහා අදාළ වන 10% හෝ කිලෝ ග්‍රෑමයකට රු.100 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු.25 ක් අයකරගෙන ඉතිරි වටිනාකමද

සහ

(ii) 2019 ජූලි මස 18 දිනැති අංක 2132/13 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ අංක 0904.21.10 යටතට වැටෙන මිරිස් (වියළි , කුඩු නොකළ හා නොඇඹරූ) ආනයනය සඳහා අදාළ වන කිලෝ ග්‍රෑමයකට රු.25 ක් වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් කිලෝ ග්‍රෑමයකට රු.20 ක් ද, අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියමය අනුව මාළු (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.02 සහ 03.03 යටතට වැටෙන මාළු, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් හැර) ආනයනය සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු. 25 ක් ලෙස සහ මිරිස් (සංයෝජිත වර්ගීකරණ අංක 0904.21.10 යටතට වැටෙන වියළි, කුඩු නොකළ හා නොඇඹරූ) ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 5 ක්ද , **2019 ඔක්තෝබර් මස 29** වැනි දින සිට ආරම්භ වන මාසයක කාල සීමාවක් තුළදී අයකර ගත යුතුය.

මංගල සමරවීර

මුදල් අමාත්‍ය

2019 ඔක්තෝබර් මස 28 වන දින

කොළඹ 01,

මුදල් අමාත්‍යාංශයේදීය.